1st Place Winner
National Productivity
Award 2020

SLSI SYSTEM ISO 9001 CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/06/ANN.TR/2025(09) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.02.05 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු - 2025

දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන සහකාර/ වැඩසටහන් සහකාර/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/ රියදුරු/ කාර්යාල කාර්යය සහායක සේවාවන්හි අදාළ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු **2025 ජුලි මස 01 වන දින සිට බලපැවැත්වෙන සේ** ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

02. ඒ සඳහා සකස් කරන ලද ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 වෙත ඔබගේ අවධානය යොමු කරවන අතර එම චක්‍රලේඛය මෙම ලිපියේ දක්වා ඇති https://www.cs.sp.gov.lk/transfer/tansfer_2025/2025_02_01.pdf දරණ දිගුවෙන් (මේ මත Click කිරීම මඟින්ද චක්‍රලේඛය භාගත කළ හැක) හෝ මෙහි සඳහන් QR කේතය මඟින් භාගත කර ගත හැක.

03. ඒ අනුව, ඉහත චක්‍රලේඛයේ විධිවිධාන හා උපදෙස් මාලාවන් අනුව වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ ( www.cs.sp.gov.lk ) මුල් පිටුවේ ඇති **"වාර්ෂික ස්ථාන මාරු පද්ධතිය"** වෙත පිවිස මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ (Online) සම්පූර්ණ කර **2025.02.23 දින ප.ව. 11.59** පෙර දත්ත පද්ධතිය වෙතට යොමු කළ යුතු ය.

04. තවද, වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ ලබා දීම **2025.02.25 දින ප.ව. 11.59 අවසන් වන අතර** ඊට ප්‍රථම ව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ආයතන ප්‍රධානීන් විසින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සම්බන්ධයෙන් සිය නිර්දේශය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. (වාර්ෂික ස්ථාන මාරු දත්ත පද්ධතියට පිවිසීම සඳහා ආයතන ප්‍රධානීන් හට අවශ්‍ය වන තාවකාලික හැඳුනුම්පත් අංකය හා තාවකාලික මුරපදය, එකී ආයතන ප්‍රධානීන්ගේ ජංගම දුරකථන අංකය වෙත ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් යථා කාලයේදී යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.)

අ.පි.බ.

05. එමෙන්ම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර මාර්ගගතව (Online) සම්පූර්ණ කිරීමේදී හෝ අදාළ වාර්තා ලබා ගැනීමේදී යම් ගැටළුවක් මතුවන්නේ නම් හෝ තාක්ෂණික සහයක් අවශ්‍ය වන්නේ නම් හෝ මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය වන්නේ නම් **091-4946365, 075-7164425 (සුරංග මයා)** අමතා තොරතුරු විමසිය හැක.

06. එසේම, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ ( www.cs.sp.gov.lk ) මුල් පිටුවේ ඇති **"වාර්ෂික ස්ථාන මාරු පද්ධතිය"** වෙත පිවිස එහි දකුණු පස පහළ කෙලවරේ ඇති HELP මත Click කිරීම මගින් ඔබගේ ගැටළුව ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමේ හැකියාව පවතින බවද දන්වා සිටිමි.

07. එසේම, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් වෙත ද මේ සම්බන්ධයෙන් නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

08. මේ සම්බන්ධයෙන් ඔබ විසින් ලබා දෙන සහයෝගය ඉතා අගයකොට සලකමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**සුමිත් අලහකෝන්,**
**ප්‍රධාන ලේකම්,**
**දකුණු පළාත.**